# 8 පෞද්ගලික අංකය සහිත කාඩ්පත < *Mainanbā Kādo* >



නගරසභා කාර්යාලයට පැමිණ සන්මු නගරයේ පදිංචිය ඉල්ලුම් කර ඇති පුද්ගලයින්ට පෞද්ගලික අංකය සහිත කාඩ්පත < *Mainanbā Kādo* > සාදාගත හැක. <u>( *Kojin Bangō Kādo* )</u>

<පෞද්ගලික අංකය සහිත කාඩ්පත < *Mainanbā Kādo* >

අංක 12 හකින් යුත් ඉලක්කම් ලියා ඇති ප්ලාස්ටික් අවරණයකින් යුත් කාඩ් පතකි.මෙම කාඩ්පතේ ඔබගේ ඡායාරූපය සහිතව, නම ,ලිපිනය, <u>උපන්දිනය</u>, <u>ස්ත්‍රී පුරුෂ භාවය</u> සදහන් කොට ඇත.
ඔබගේ <u>හැදුනුම්පත</u> ( *Mibunshōmeisho* )වශයෙන්ද භාවිතා කිරීමේ හැකියාව ඇත.







## (1) කුමන අවස්ථා වලදී බ භාවිතා කළහැකිද ?

① බැංකුවේදී ඔඅබගේ ගිණුම් පොතක් විවුර්ත කිරිමේදී
② කොන්බිනි යකදී ඔබගේ <u>පදිංචි සහතිකය(*Jyūmintōroku hyō*)</u> <u>**සීල්එක ලියාපදිංචි කර ඇති සහතිකය** ( *Inkantōroku Shōmeisho* )</u> ලබා ගන්නා අවස්ථාවලදී
③ <u>සෞඛ්‍ය රක්‍ෂණ කාඩ්පත ( *Kenkōhokenshō* )</u>ලෙස භාවිතා කරන විට
විදේශ රටකට මුදල් යැවීමේ දී
④ අන්තර්ජාලය හරහා <u>ආධායම් බදු සදහා බදු වාර්ථා</u> ගොණුකිරීම






## (2) කුමන ආකාරයකට ඉල්ලුම් කරණවාද ?

① සන්මු නගරයේ පදිංචිය ඉල්ලුම් කල පුද්ගලයින්ට මෙය ඉල්ලුම් කිරීමේ හැකියාව ඇත.
② කරුණාකර නගරසභා කාර්යාලයට පැමිණෙන්න
③ අයදුම් පත්‍රය සම්පුර්ණ කරන්න
● නගරසභා කාර්යාලයේදී ඔබගේ ඡායාරූපය ගැනීමට හැකියාව ඇත.
● ජපානයේ රැදීසිටීමේ අවසර කාලය මාස 3 කට වඩාඅඩු පුද්ගලයින් පදිංචි කාලය දීර්ඝ කිරීමෙන් පසුව මෙම කාඩ් පත සදහා ඉල්ලුම් කරන්න.

## (3) ඉල්ලුම් කිරීමෙන් පසුව කුමක් කළයුතුය?

① ඉල්ලුම් කිරීමෙන් පසුව දින ３０ක කාලයකදී පෝස්කාඩ්පතක් නිවසට පැමිණේ
② නගරසභා කාර්යායට දුකථනයෙන් අමතන්න.කාඩ්පත ලබාගැනීමට පැමිණෙන දිනය දැනුම්දෙන්න.
③ පහත සදහන් දෑ නගරසභා කාර්යාලයට රැගෙන යන්න.
〔පෝස්කාඩ් පත, පෞද්ගලික අංකය දැනුම් දීමේ කාඩ්පත < *Mainanbā no Tsūchi Kādo* >
ජපානයේ පදිංචිය සනාථ කිරීමේ හැදුනුම්පත ( *Zairyū Kādo* )〕

## （4） ප්‍රවේසම් වියයුතු කරුණු

පෞද්ගලික අංකය සහිත කාඩ්පත < *Mainanbā Kādo* > භාවිතා කළහැකි කාලසීමාව වන්නේ ඔබගේ ජපානයේ පදිංචිය සදහා අවසර දී ඇති කාලයහා සමානවේ.

එම කාලසීමාව අවසන් වුවහොත් පෞද්ගලික අංකය සහිත කාඩ්පත < *Mainanbā Kādo* > භාවිතාකළනොහැකිය.

<u>ආගමන විගමන කළමනාකරණ ආයතනයෙන්</u> ඔබගේ ජපානයේ පදිංචි කාලසීමාව දීර්ඝකළහොත් නගරසභා කාර්යායටගොස් පෞද්ගලික අංකය සහිත කාඩ්පත < *Mainanbā Kādo* > ඉල්ලුම් කරන්න.

ඔබට මෙම කාඩ් පත ඉල්ලුම් කිරීමට හැකිකාලසීමාව ඉක්ම ගියහොත් මුදල් වැයවේ.

ඒ පිළිබදව ප්‍රවේසම් වන්න.



◎ 22 පිටුවේ සහ 23වෙනිපිටුවේඅමාරු වචන ◎

※උපන්දිනය ： ඔබගේ උපන් දිනය

※ස්ත්‍රී පුරුෂ භාවය ： ගැහැණු පිරිමි බව

※හැදුනුම්පත (*Mibunshōmeisho*) ： ඔබ ජපන් ජාතිකයෙක්ද? යනවග තහවුරු කිරීමට හැකි දෑ 〔<u>රියදුරු බලපත්‍රය</u> ( <u>*Jidōsha*</u> *Unten Menkyoshō* )යනාදිය 〕

※පදිංචි සහතිකය(*Jyūmin hyō*) ：ඔබගේ සහ පවුලේ සාමාජිකයින්ගේ ලිපිනයසදහන් කර ඇති ලියවිල්ල ( මෙය ලබාගැනීමේදී මුදල් වැයවේ)

※සීල්එක ලියාපදිංචි කර ඇති සහතිකය ( *Inkantōroku Shōmeisho* ) ： නගර සභා කාර්යාලයේ ඔබගේ සීල් එක ලියා පදිංචි කලවිට ලබාගත හැකි සහතික පත්‍රය( මෙය ලබාගැනීමේදී මුදල් වැයවේ )

※සෞඛ්‍ය රක්ෂණ කාඩ්පත ( *Kenkōhokenshō* )：රෝහලේදී ඔබ ගෙවන මුදල් ප්‍රමාණය අඩු කිරීම සදහා භාවිතා කරනුලබන කාඩ්පත.

※ආධායම් බදු වල බදු වාර්ථාව ： රැකියාව කර වැටුප් ලබාගත් විට බදුකාර්යාලයට බදු ගෙවිය යුතුවේ.

※ආගමන සේවා නියෝජිත කාර්යාංශය ： තොක්යෝ ආගමන කාර්යාංශය,චිබා ශාඛා කාර්යාලය

〒260-0026 චිබා නගරය,චුඕකු,චිබා මිනතෝ 2-1 චිබා මධ්‍යයම ප්‍රජා මධ්‍යස්ථානය ඇතුළත
( Chiba Chuo Community Center , 2-1 Chiba-minato, Chuo-ku, Chiba City,Chiba Prefecture. )
දුරකථන අංකය ： 043-242-6597

| වැඩි විස්තර දැනගැනීම සදහා(විමසීම්) | ලිපිනය | දුරකථන අංක |
|---|---|---|
| මහජන සම්භන්ධතා අංශය ( *Shiminka* ) ( පෞද්ගලික අංකය සහිත කාඩ්පත < *Mainanbā Kādo* > ) | 296 බන්චි,තොනොදයි,සන්මුනගරය ( 296,Tonodai,Sammu-shi )කවුළු අංක ⑤ | 0475-77-8110 |

< විමසීම් කළ හැකි වේලාවන් > සදුදා සිට සිකුරාදා දක්වා පෙරවරු8.30සිට පස්වරු 5.00 දක්වා

※සෙනසුරාදා,ඉරිදා,රජයේ නිවාඩු දින සහ දෙසැම්බර් 29වෙනිදා සිට ජනවාරි 3වෙනිදා දක්වා නිවාඩු දින වේ.